

# සිංහල ධර්ම සාහිත්‍යයේ ආරම්භය

## - අනුරාධපුර යුගය 2

රොක්බෑන්ක්හි පාරමිතා බෞද්ධ විහාරවාසී,
මහනුවර අස්ගිරි මහාවිහාර මහ පිරිවෙණේ ආචාර්ය,
**ඉඳිපරපේ ධම්මසිරි හිමි**



සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසකට පසුව පවත්වන ලද පළමු ධර්ම සංගායනාවේ දී බුද්ධ-දේශනාවන් ධර්මය සහ විනය වශයෙන් දෙකොටසකට බෙද සංගායනා කළ බව ශාසන ඉතිහාසයේ සඳහන් වේ. එහි ධර්ම කොටසට අයත් සූත්‍ර පිටකය යළිත් කාණ්ඩ පහකට (05) බෙදේ. ඉනුත් ඛුද්දක නිකාය නම් කොටසට අයත් ධම්මපදය තරම් ගිහි පැවිදි කා අතරත් වැඩි වශයෙන් භාවිත වූ වෙනත් ග්‍රන්ථයක් නැති තරම්ය. ධම්මපදය හඳුන්-වන්නේ බෞද්ධයාගේ අත්පොත නමිනි. එම ග්‍රන්ථයට බුද්ධඝෝෂ හිමියන් කළ අටුවාව ධම්මපදට්ඨ කථාවයි. එකී ධම්මපදට්ඨ කථාවට කරන ලද සිංහල සන්නය දම්පියා අටුවා ගැටපදය ලෙස හැඳින්වේ. එහෙත් ග්‍රන්ථයේ කොතැනකවත් එනමින් මෙම ග්‍රන්ථය හඳුන්වා නොමැත. 'දහම්පියට කළ අටුවා සන්‍යය' යන්නෙන් පැහැදිළි වන්නේ මෙය අටුවාවකට වඩා සන්නයකට වඩාත් සමීප බවයි. කතුවරයා වන්නේ පස්වන කාශ්‍යප (ක්‍රි.ව. 908-918) රජතුමන්ය. සන්නය නමින් හැඳින්වුව ද පදයෙන් පදයට තේරුම කීම පමණක් නොව ඒවායේ විස්තර ද අඩංගු වේ. "මහාමෝහ තමෝනද්ධේ ලෝකේ ලෝකන්ත දස්සිනා - මෝහ යනු අවිජ්යෙහි සඃද්ඃඃද; තම යනු අඳුරුයෙහි සඃද්ඃඃද; මෙතැන් දෙජ් අවිජ් මෙ කියා අවිජ අරමුණෙහි මුළාවන අටින් මෝහ නම් වෙයි "

භික්ෂූන් වහන්සේලාගේ විනය සම්බන්ධ නීතිරීති ඇතුළත් කොට සැකසුණු ග්‍රන්ථය සිඛවළඳයි. උගතුන්ගේ මතය මෙය දහවැනි සියවසේ දී පමණ රචනා වූ බවයි. කතුවරයා සම්බන්ධ ව නිශ්චිත නිගමනයක් නැත. සිඛවළඳ විනිස නමින් මීට ම අයත් වන අනෙක් ග්‍රන්ථය උපසම්පදලාභී භික්ෂූන් වහන්සේලාට විනය පිළිබඳ හදරන්නට සැකසුණකි. පුංචිබණ්ඩාර සන්නස්ගලයන් සිය සාහිත්‍ය වංශය නම් ග්‍රන්ථයේ කරන සඳහන අනුව මෙම ග්‍රන්ථ පැරණි ම සිංහල ගද්‍ය කා-ව්‍යයන් ලෙස සැලකිය හැකිය.

අනුරාධපුර යුගයට අයත් සිංහල සාහිත්‍යයේ විශිෂ්ටතම නිර්මාණය ලෙස සීගිරි ගී සැලකිය හැකිය. ධර්ම මාර්ගයෙන් මඳක් ඉවත් ව සෞන්දර්යාත්මක අංශයට නැඹුරු වූ රසවත් පද්‍යයන් රාශියක් සීගිරි ගී තුළින් අපට හමුවේ. සීගිරි ගී එක් අයෙකුගේ රචනාවක් නොවේ. පළමුවන කාශ්‍යප රජතුමන් ස්වකීය රාජධා-නිය ලෙස තෝරාගෙන ගොඩනගන ලද සීගිරිය කලාගාරයක් හා සමානය. සියලු පහසුකම්වලින් යුත් මේ රාජධානියේ අසිරිමත් බවින් ඔද වැඩුණු සිත් ඇති රසිකයෝ සිය භාවාත්මක හැඟීම් සීගිරි කැටපත් පවුරෙහි සටහන් කළහ. විශේෂයෙන් සීගිරි අප්සරාවන්ගේ බිතුසිතුවම් සියලු දෙනාගේ නෙත්සිත් පැහැර ගන්නට සමත් විය. එම අපසරාවන්ගේ විවිධ ඉරියව් හා ඉන් දැක්වෙන චමත්කාරය රසිකයන් විඳගත් ආකාරය සීගිරි ගීවලින් ප්‍රකට වේ. සීගිරි ගීවල තවත් විශේෂත්වයක් වන්නේ ගීය ලියූ පුද්ගලයාගේ නම සඳහන් ව තිබීමයි. මහාචාර්ය සෙනරත් පරණවිතානයන් මෙම සීගිරි ගී අතුරින් 685 ක් කියවා සිංහලට පරිවර්තනය කර ඇත.

"බෙයන්ද් නැගි බැලුමො - රන්වනුන් අතුරෙන්
හිණ පිළි ලිහිලස් - කතක් ද අප හිමබුයුන්
හො." (351) සිරිද අග්බොයි ලීම්.
(සීගිරි පර්වතයට නැගී බැලවෙමු. රන්වන් ගැහැණුන් අතරින් එකියක හිණ ලිහිල් වස්ත්‍රය විය. ඇය අපගේ සුන්දරිය ද ? මෙය සිරිද අග්බොයි වන මම ලීවෙමි.)

මීට අමතර ව සීහලට්ඨකථා මහාවංසය, ථූපවංස වණ්ණනා, ආගතවංස වණ්ණනා, විමුක්ති මාර්ගය, නමස්කාර වණ්ණනා, එළු දළදවංස කාව්‍යය, හෙළු සූත්‍ර, කේසධාතු වංශය, දහම් කවි ආදී ග්‍රන්ථයන් ද අනුරපුර යුගයට අයත් බව විචාරක මතයයි. ඇතැම් ඒවා නාමමාත්‍රිකය. කෙසේ වෙතත් අප මෙහි දී වඩාත් අවධානය යොමු කළේ ප්‍රධාන වශයෙන් සැළකෙන ග්‍රන්ථ කිහිපය පිළිබඳ ව පමණකි. මෙම යුගයේ සාහිත්‍යය වැඩි වශයෙන් පාලි භාෂාවෙන් රචිත ග්‍රන්ථයන්ට සිංහල විස්තර වර්ණනාවන් සැපයීමට අවධානය යොමු කර ඇති සැටියක් පෙනේ. නිර්මාණාත්මක බවින් පිරිපුන්, සාහිත්‍ය රසයෙන් අනූන කෘති රචනා වීම ඇරඹෙන්නේ මධ්‍යතන යුගයේ හෙවත් පොළොන්නරු යුගයේ සිටය.

**මතු සම්බන්ධයි .....**

සන්නස
බලන්නට ඇති පත්තර අතර
කියවන්නට ඇති පත්තරයක්

## සන්නස Cartoon by PK






# FRENCH TUTOR

Thirty seven years experience in teaching FRENCH.
Help students to become top achievers by improving critical thinking and inference skills.

**New classes begin 7 January 2013.**

The group classes at the Mount Street Neighbourhood House, Glen Waverley.
300 m through Hinkler road (opposite Chemist Warehouse) from Springvale Rd
cost: $10 per class(duration 1h30)

**Contact:**

**Vasantha Lokuliyanage**

Phone: (03) 9764 9609
Mobile: 0401 481 667
Learning French made easy



## Notice

**Why secondary school children in Victoria need to learn a foreign language?**

A talk on the importance of learning a foreign language & how this language should be studied effectively in the secondary school followed by a Q&A session will be held at the Mount Street Neighbourhood House, Glen Waverley. [300 m through Hinkler road (opposite Chemist Warehouse) from Springvale Rd] on 5 February 2014 at 16h30.Entrance is free. However the interested parents who wish to attend need to register by calling Vasantha Lokuliyanage , 9764 9609 / 0401 481 667 or sending an e mail to info@frenchpedagogue.com